# පැරකුම්බා සිරිත.

කාව්‍යශාස්ත්‍රාති දක්ෂ පුරාතන පඬිවරයෙකු

විසින්

රචනාකරණ ලද්දකි.

කේ. ඩී. පෙරේරා සහ පුත්‍රයා විසින්

කොළඹ

විද්‍යාදශී යන්ත්‍රාලයේ

අච්චුගස්වා ප්‍රසිද්ධකරණලදී.

බු. ව. 2461.

ක්‍රි. ව. 1917.

# සංඥාපනය.

බලපරාක්‍රමයෙන් හා දශධර්‍මමයෙන්ද රාජ්‍යකරමින් විසූ ශ්‍රී පරාක්‍රමබාහු නම් රජකාලයෙහිදී එම රජාණන්ගේ පුණ්‍යගුණෞඝයන් හා කීර්ත්තියද වර්‍ණනාකරණු සඳහා යම්කිසි සමර්‍ථ පණ්ඩිතයෙකු විසින් නොයෙක් වෘත්තයෙන් යුක්තවූ සුමිහිරි කාව්‍යයන්ගෙන් රචනාකරණලද මෙම පොත පැරකුම්බා සිරිතයයි නම්විය. මෙම පොත එකල්හිට තොටගමුවැසි ෂට් භාෂා පරමේශ්වර ශ්‍රී රාහුලස්වාමිපාදයන් වහන්සේ විසින් රචනාකරණලදැයි සමහරු කියති. සමහරක් එය ශංකාකරති. ඒකොසිහැපිවෙතත් මෙය ඡන්දස් ව්‍යාකරණාදි අලංකාර ශාස්ත්‍ර මාර්ගයට එකහව සාදනලදින් එහි කර්තෘ එකලට විසූ කාව්‍ය ශාස්ත්‍රයෙහි දක්ෂයන්ගෙන් එක්කෙනෙක්වාට ශංකා නැත. මෙහි කාව්‍යයන්ගෙන් සමහරක් සංස්කෘත වචනයන්ගෙන් මිශ්‍රවතිබේ. එසේ කරණලද්දේ කර්‍ණරසායනය පිණිස සහ කාව්‍යය ප්‍රාණවත් කරණු සඳහාමයයි සිතිය හැකිය. එඑ ඉගණගන්නන් විසින් අගයකොට සලකා භාවිතාකරන්නාවූ මෙම පොත උගත් මහතෙකු ලවා සුද්ධකරවාගෙණ ජේ. ඞී. පෙරේරා සහ පුත්‍රයා විසින් විද්‍යාදර්‍ශී යන්ත්‍රාලයෙහි අච්චුගස්වා ප්‍රසිද්ධ කරණලදී.

# පැරකුම්බා සිරිත.

1 පිහිටි කුළුණඹතු ර
දහම් මුවරදරසඹ ර
සෙමී පුරතරබම ර
වඳිම් මුනිරජ තඹර සිරිස ර.

2
මුනිබසගින් පහ ළ
මගසිලිල පල සිසිල ළ
පිවිතුරු මොක්වෙර ළ
වඳිම් අදරින් දහම්ගඟ ලෙ ළ

3
පෙළදම් නියරපු න
ඉහුකළ සිල්දියෙන් ප න
මගපල කරල්ග න
වඳිම් මහසඟ පවර පින්කෙ න

4
ස න න සක සකඅ න
නි තෙ න ගජවන බරතෙ න
න ල න ගුරු කිවින න
ස න න සලසත්මෙහුරසුබසෙ

5
කළෙළොත් ගුරු සේ වේ
හුවඳ පනතල සේ වේ
නොකරම එ සේ වේ
බඳුන්කිවිනළු බස් කෙ සේ වේ

6
මගත වියතුන් බ ස
නොදුනත් ඇසුව වෙතො ස
දූසමත් මල්රැ ස
නොසිඹ ඇසුවත් දූනේ ඇතිලෙ

7
වියතුන් ඉදි රි යේ
නොහෙබි කුකවි ස රි යේ
දිවපුරු ඉදි රී යේ
කෙසේ බැබලේදකනමැදිරි යේ

8 පැහැය සුදු නිල් ර තු
ඇසටම පෙනේ ඇතිත තු
තෙපලනු කිම අඹු තු
දකිත් හුවනැතියො කිවි බසන තු

9 අතුරුකප පෙර උපන් බඹපුත් විවස්වත් මනුරජකුලෙන්ප න
ඔක්කාවස් පුතු බැණ මත්දතු පසේනදි සුදපුත් බගීර න
නහුනසන්කන රඝු දිලීපති සන්කු නලනා බාග දසර න
රාම ලක්මන කුසලවාදී පසිදු සක්විති රජුන්ගෙන් පු න

10 ද හ ම් සෝ රජ සසිරි මාබෝ දකුණුසාකා එවන මෙලක ට
උතු ම් තඹකුලෙනෙවී සුමිතුරු කුමරු සමඟින් ක්ළුලන් දසඅ ට
ද කි ම් නී උන් දෙවෙනිපෑතිස් ලකිසුරු සෙද පෙරගමන්කොම ට
වැඩුම් කර ඒ දුමිඳු අනුරා පුරවෙතෙහි පුද පෙළහරින්සි ට

11

එ කල එනිරිඳු සුමිත් කුමරුන් පලදවා මිණි බටුනු පිවිතු රෑ
උ දු ල සත් මගුලැතු පිරිත් පුර වැඩුම් කරවා පුදෙන් විසිතු රෑ
නි ම ල කුල පරපුරෙන් එනලෙස දෙමින් ජයමගලෑතනතතු රෑ
වි පු ල අදරින් ඇලසි දුම්දුන් පුද සිරිත් කරවනුය නිරතු රෑ

12

මෙලක රජසල පවර ගජබා නිරිඳු මාතොට පුරෙන් සොළිර ව
එකල සැටදස් පුරා ගෙනගිය දෙලොස් දහසක් දනන් සිරකො ව
අසා රුහැණිව ගදගෙන පහලොස්රියන් තුන් රියන් ඇති ව ව
මුහුද පීණ උරනලෙනි ගැ සඳුන් යොමිකා ගොසින් එතර ව

13

පිවිස සොළිපුර එරජගෙට ගොස් සමග සිංහාසනේ උන් ස ද
මෙලෙස සිහළිඳු තනිව ආවේ කිමෙක පුළුවුත් සෙමෙන් සොළිර ද
දෙලොස් දහසක් පෙරප තුඹරින් දනන්ගෙණ අ තුබගෙ පියර ද
තොලෙස ගෙනයනලෙසට ආවෙමි කියන තෙපුලක් වෙමින් වැඩිඹ

14

නිරිඳු සි සී කියනු කිම බස් මෙසේ නොතකා අප සොලින් මැ ද
තවද වැලිමැඩි තෙල් සපාදිය ගතැකිඅැ කවුරුන් විසින් ත ද
එසඳ සොළියා බසට යකඳ අතින් මිරිකා රුපැයි දිය ක ද
පැහැද දුන්සඳ අඹුනොමොට ගැණ සුවිසිදහසක් දනන් නිවර ද

15

රජෙ ක් සිරිසඟබෝ නමින් යුත් තවට වලවැද පවට බා
උ ද ක් මෙත් සිත් වෙමින් උන්සඳ එකල් හරනිඳු ගොළුඅ බා
යමෙ ක් ඔහු සිර ගෙනා නම් දෙන ලෙසට දහසක්රන් ත බා
එ ව ක් අණබෙර ලැවී රට ඒ අසා බැලයෙක් දන ලොබා බා

16

.ගො සි න් වලවන් නිරිඳු දුටුසඳ අසා ඔහුගෙන් රට පුව ත්
තො සි න් සිය සිර ඔහුට දුන්දී එවිට දෙස්කි ගිය තැන ත්
රි සි න් බුදු බව ලබන බුදුකුරු දහම් සපයන එබෝස ත්
ය සි න් සිරිසඟබෝ නමින් දුන් ලියනි වනුවක් රජ මහ ත්

17

සොදින් මහසෙන් නමැති මහසෙන් රජෙක් දේනාමවෙහෙරනුරපුර
රි ය න් සතලිස් පුරා සියයක් කරවමින් මහ සෑයක් මනහ ර
බු දු න් ගුණ සලකා පටිඳු පුරපුරෙන් බසිවසි ඉටන්ක ර
ගු ති න් නොවැඩිය රාබොමිරා විත අතින් ගෙන සිපීය එමව ර

18

වසාගෙන උන් සුරිඳු තුබගැබ ලඹපටිඳු එනරනිඳු දු ක
දමා රාවින සුවඳ සිලිලෙන් දෙව තමා සුබ ලකුණු ඇත්දෙ ක
එදා අලවන අසූ රියනක් පමණ දිගුකර නැගී අහස ක
යොදා උකුලේ තිබූ සිරියද ගෙන කැපි පැන ඉන් අඹක් එ ක

19

වී ගෙස් භව ලක මිහිඳු මහහිමි පුද සිරින් පැවතෙන ස ද
සඳ ගෙස් කලිගෙක් වඩා සපැමිණි දකුණු දළදා වැඩි පු ද
උ ගෙස් සත් මහලින් අලුත් ලෝමහාපා කර මහත ද
ගම ෂස් තෙදිගත පතල විය කිත් සිරිමෙවන් නරනිඳු ස ද

20

වෙහෙර දසවක් පුරා කරවා දස අටක් මහවැව් බැ දී
ව ස ර එකඳ බිසව් අබිසෙස්හෙණුවන් තෙමගුල් සෙ දී
අ ජ ර කිවියර සිනින් ජනකිහරණ අෑ මහ කව්බැ දී
කු ම ර දස් රද කාලිදස් නම් කිවිඳුනට සිය දිවි පි දී

21

වී සු නාලොව පවා හයිඳුන් නිරෝකර ලැබ මිණි ම නා
මු සු කරුණ නුවණ ගුණයෙන් සතන්හට මවු පිය මෙ නා
අ සු මගසව් නම් තබා කුමරුන් අසූවක් ලැබගෙ නා
අ සු වක් අවුරුදු කෙළේ රජ බුජස්රජ ලෝ වැඩ ත නා

22

දෙ වූ පතිස් රජ අනදමහ රුව රතින් කළ රතයක ව ඩා
ඉ වූ මෙ තුන් රජගේ සගුන් සහ රුවන් පිරිතින් පැන්ව ඩා
ප වූ න වේමැද ඇවිද රෝදුක් දුබික් දුරුකර හැර වී ඩා
තු වූ කෙළේ ලක කලට මහ මේ වස්වමින් දිය සෙත් ව ඩා

23

වි ය ත් සිළුමිණි ඇදුරු බුදුගොස් මහතෙරුන්හට දඹදිවින් වැඩි
ම ග ත් වෙහෙරක් රකින්කරවා දෙමින් තෙකලෙක පමණ අඩුවැ
සු ග ත් හට මෙන් පුද වැඳ නිති ලියවමින් අටුවා දහම් වැඩි
දි ග ත් ගෙබවී යසින් මහණව මුනිසිරින් මේ නිරිඳු සිරි වැඩි

24

තෙ ම ල් හළ මුනි ලෙසින් වදහළ මෙලක රකිනුය මෙත්සිතින්
උ පු ල් වන් දෙවි මහරජාණන් වඩිනු දක මහසුර ප තින්
නි ම ල් ගුණපුත් නමින් ද පිළිසඟ රජෙක් ආවෙමාහොතින්
වි පු ල් සිරි දෙවු නුවර කරවා පිහිට කරවින යහ ප තින්

25

සඟිරි මානා පුළු පුරෙහි ඉඳු පරපුරෙන් අා පරසි දු
සොළින් වනෙව තිබූ රට නෙක සගානුවක් අවුරු දු
මුනි සසුන් රට වවා අමුතුව මිනුරජෙව් පිළිගෙල සෑ දු
එසිරි සඟබෝ විජයබා රජ විසි පනස් පස් අවුරු දු

26

පොළොන් නරු පුර එ පැරකුම්බා නිරිඳු ලක එකසත් ක රා
ගො සි න් අරමණ සොළී පඬි රට රුගෙන සුදයෙන් යස පු රා
ගෙ හෙ න් දෙදහස් පන්සියක්මන වෙහෙරකරවා මහග රා
තෙ දි න් දිවයුරු ලෙසින් බැබලි ලෝ සතුන් දුක් දුරුක රා

27 මෙලෙස තෙදබල මහත් අණසක ඇති රජුන්කුල පිවිතු රු
සවුළු විජයබ නිරිඳු පින් පැරකුම් රජුන් හට මුනුබු රු
ලැමණි ජගම්බහ ලැන ගිමි සුර තුර වෙළු රස්ලියගු රු
සුනෙත් මහ දෙවි බිසෝ ගිම්ලන් රජරුවක් යොද බුදු කු රු

28 උතුම් ගුණයුත් වෙපැරකුම්බා නිරිඳු රඝිගම්තම් පු රා
බරණ සිව් සැට සිද්ද බවුනුත් පැළඳ විලසින් පුරඳ රා
භවලඳ ගොවිකුල වත්නි තිරිඳුන් නොදුන කලනොසිරිත්වරා
බබුලුවා ලෝ සසුන හෙබෙහි සරාමිත් කුල දිවගු රා

29 දකි තු මෙතිරිඳු නුවන් ලන් පල ලැබෙයිසිතුවොත්දුකඇරේ
තුඹුතු රස බස් ඇසුව දෙපී ලොව සැපත් සිදුවෙන අරන රේ
දිමුතු යසතෙද නුවණ ගුණ කිව කැමති ගම් දෙයසිදුකෙ රේ
අමුතු බැදි පද කියම් එබැවින් අසව වියතුනි සබතු රේ

30
පැහැදි සරම්බා රුදිමනර ම්බා
තුනු සිරිර ම්බා පතිපිළි බිම්බා
රුපුරජ රම්බා රණමතකු ම්බා
දිනපැරකුම්බා ගිම් තෙවිකුම්බා

31
රනගල්නලපුරුපැහැසරපුළුර
මෙනදෙව් ගජරජ කරදිගුගුගසර
මනපිණවන සල් පුල්තුරුසිරිබර
දිනකැප්කුලමිණි පැරකුම්නරව

32 ල ක තු න් රට මුළු දඹදිව පිළිබ ද
නි රි දු න් බිගුකැස් ගුණ සුවඳින් සො ද
අ වි දි න් ගෙණයන රන්මිණි මුවර ද
මෙ ර දු න් සරණන නඹරෙකි මනන ද

33 සගුණෙන් පුවතර මෙනිරිඳු යසො බා
තිළිනෙන් ජයගෙන දළලඹ නිල ඹා
බලසෙන් ගත් ලෙල විදුලිය සප බා
සොබමන් පද සිරි වැනි රත් සල ඹා

34 සි ළු මිණි රජ මොහු සදවවොර පුව ලා
ස ළු මිණි බරදුල් ගව සන නිම ලා
මු ළු ලොව උසුලන රත් වැම් සඟ ලා
මල ළු මෙන් දන මණ පිණවයි කොව ලා

35 දි න සර සියලං මිණි සර පුව ලා
මි ණ ඉන සැදරල මුතුපෙන ඹස ලා
ග ණ වෙර ළත යස පිළිණෙස් වත ලා
ග න වැලිතල වැනි මොහු පුළුලුකු ලා

36 පි ත් සර පැරකුම් නිරිඳුගෙ සිරිමි ත්
දු ත් කොකුම්ගණ උරමුතු ගරගු ත්
ර ත් වන ගිරි තල වැද පිළි බිඹු ප ත්
මෙ ත් තරු වැල බැබළිණි සඳරා ත්

37 ර තු මිණි නව පළු නිල් මිණි කොල ද ර
මු තු මල් පිපි රන රෙස්මල පැහැස ර
සි තු ලෙස දෙන වි[illegible]ණ ගුණපලබ ර
අ තු සිර් ගති මෙනිරිඳු අන සුරතු ර

38 මැ ද ලප වැනි රසඳුන් වැකි යුග ගෙන ත
බ ද තිරු වැලමිණි අබරණ සවන ත
මි ද හස සඳකැත් වැද සන නෙතනෙ ත
ස ද මඩලකී පැරකුම් රජ උවන ත

39 දියනෙන කුලපති මෙරජුගෙ මනන ද
සි රි අන රන් දපණෙවි උවනනතෙසා ද
යව න ත රන් මිණි කැත් රිවි රැස් වැ ද
පැහැපත නවපුල් පියුම්සා හැමස ද

40 වි දු ලිය තරසර තුහුසිගු සිරින ත
ඉ දු ඉඳුසැවි සිය ඈත එකි මුදුන ත
බු දු කුරු මෙනිරිඳු රත්කිරුළුන ප ත
රැ දු නම් මිණි කැත් එම විලසින් යු ත

41 මහසෙන් පිරිවර තරුමැද සඳයු රු
ගන රන් රනයට නගිමින් විසිතු රු
මෙරදුන් පැදකුණු සළුලෙස පුරතු රු
සුද සුත් මෙව් මැද පත් වැනි පුරඳු රු

42 න රි ඳු ගුණයෙන් ගැඹරින් කි රි ඳු
කි රි ඳු බලයෙන් දිරියෙන් ගි රි ඳු
ගි රි ඳු නුවණින් විකුමෙන් සි රි ඳු
සි රි ඳු දින පැරකුම් බුජ නි රි ඳු

43 ම නා ර ම් සිරිපති සරසවිරාව ත්
ග ණ ගු ම් සක්සෙව් වෙරලින තුරු යු ත්
මි හි ගු ම් මින් නද පුන්සඳ නැදව ත්
පැ ර කු ම් රජ සයුරෙකි සාග මිණිග ත්

44 මෙනිරිඳු සුනිමල් යසසට දිමු තා
එක බිඳු වනාලෙන පැහැයෙන් තුමු තා
සුරනිඳු නුසුලා ගජනන සත තා
උරගිඳු විදු සෙව් කෙලෙසඳ තිනෙ තා

45 දිය බඳ සිවුවන කලතුරු සෙනෙහ ස
සිරි සඳ සරසවි වෙත සමගවැ වැ ස
මන නද පැරකුම් හිමි [illegible]ුබ ගුණ රැ ස
කෙළෙසඳ පරදර පව් දුරුකළ ලෙ ස

46 දුල යස පැරකුම් රජ දඹදෙනි වැ සි
කුල වත්නිත් මැඩ තෙදබලයෙන් නි සි
තිල ලෑ සිරිලක තැත්පත් කළ ලෙ සි
කැලෙ බුණු දිය පෑදු වැනි අගති සි

47 හිර තර පැරකුම් රජ කී මෙහෙව ර
කර මුදුනත සෙන් වැඳ සොළියා සු ර
වර කඳසුරු සිඳ මාලවරාය ර
පැර සූ පැලඹෙන තෙදකින් බාසු ර

48 අණ තද මෙනිරිඳු වැකි තොම් කාලම
ගුණ සරු අකරණ වත් ගණි කාලම
බැණ නැඟි තද අසමිත් රත් කාලම්
රණ දෙරණන නො සැලේ දේ කාලම්

49 උසුලනු පෙනනුය දෙරණින් ලිය තුරු
සමනිරිඳු දූන් සුරකින් ගත් පිපි තුරු
තිලපුල් පැහැසුරු කගලිශ නිර තුරු
මිහිකත උසුලා කිය ලිය විසි තුරු

50 රණහන වන් රුපු වෙරලෙසි දිය ඉ සි
සගලිය මෙරජුගෙ යස මල් පිපි නි සි
එනි රජ සිරි පල ගෙන ගෙලෙ දම් රැ සි
සත දද ගණ තුටු කළෙ මුළු ලොව වැ සි

51 ගරු තර තිර සර ගිරිසරි ගි රිදුත්
හිරු කුල කිරි සමුදුර සුරු තු රිදුත්
සරු ගුණ පැරකුම් රජ සරි සු රිදුත්
කිරු ලිය පැලඳවි සොළිපති නි රිදුත්

52 ක ල දේ  කොඳ කිරි නව හස හා  ණ
යස දේ  පැරකුම් නිරිඳු උද  ණ
නී රිදෝ  සඳ රිවි කුල සරූ සා  ණ
බැ ද දේ  මුදුනත් සිටිති නෙවා  ණ

53 මෙ නිරිඳුන් විකුමෙන් සිතුවොත් වැර ස  ර
මහමෙර තුඹසෙකි කිඳලෙකි සමුදු  ර
සියදෙර වැලි මළුවෙකි දඹදිව් ත  ර
නොසු රජ නරපණුවන් කිම බැඳ වෙ  ර

54 මෙ රදුන්  තිර ගුණ ලබනුව මෙර ගි  ර
සු රි ඳු න්  මුදුනෙන් උසුලා ගැම ව  ර
අ ඹ කි න්  තම තුනු ගිලෙමින් සමුදු  ර
න ව ද ම්  රකිනේවි සහ ගිරි පිරිව  ර

55 තු ල්  ගජ හය රිය මුතු පට වා  ස ත්
ව ල්  විදනා සුග ගිණි වැල සේ  ස ත්
බැ ල්  මේන් පැරකුම් නිරිඳුගෙ පෝ  ස ත්
ක ල්  නො යවා ලැබ වෙති දන පෝ  ස ත්

56 පු ණ  සතොස් සැනී සිවුරන් නිත  රේ
ව ණ  නොපිළිවෙති පව්ගණ අඳු  රේ
ගු ණ  ලොවට පැරකුම් රජ පව  රේ
ස ණ  සඳෙව් හෙබවිය සසුන ඹ  රේ

57 මෙ ර දු න්  සැපතින් පුර දුරූ අනු  රූ
සතො සි න්  දෙන නිති මග දන් වතු  රූ
ව ස මී න්  යදි ගඟ මහනෙළු ඉතු  රූ
පු ර මි න්  වනලෝ යස කිරි සනු  රූ

58 බා ති ය  රජවන් පැරකුම් දින ර  ද
ජෝ ති ය  සිව්රඟසෙන් රුස් කළු ස  ද
ජෝ ති ය  සිරි නරවර ගණඳර ක  ද
බී ති ය  කර ගිය පරසක්වළ වැ  ද

59 කි වි  කැලන් ඔද යසසින් සුර ර  ද
රි වි  කුලෙන් පැවතෙන පැරකුම් ර  ද
ගැ වි  සුරත සිරිපා සර මුව ර  ද
නි වි  නැවුල් සින ඈපා ගස ර  ද

60 පි නි පා  වණ් පිරිසිදු යශ වතු  රෑ
සි රි පා  සෙද යුත් මේරද සොඳු  රෑ
සි ය පා  නියරැස් ගඟබෑස මහ  රෑ
ශ ත පා  ගති කිවි ගම්පල කුමු  රෑ

61 ර ත්  කොඩිමෙන්  වැඩි මුළුලොව පසි  දු
පි ත්  දූ ඩි යෙ ත්  වැඩි පැරකුම් නිරි  දු
ම ත්  එ ඩි යෙ න්  අඩියක් පසු නොවි  දු
ක ත්  හ ඩි ම ත්  වැඩි විකුමෙණ් පුරෑ  දු

62 සෑ රි ය  රජමෙත් පෙර සිත පුරෑ  දු
වි රි ය  බල විකුමෙණ් සරි හිමි  දු
ආ රි ය  සක්විති රජකුල කුමු  දු
සූ රි ය  හිමිදින පැරකුම් නිරි  දු

63 පු ත්  ගෙලෙ වේ පිය පතරින් මන ර  ඟ
න ත්  හර කිරි බිව් සියකුසතුල ල  ඟ
කි ත්  හර පැරකුම් නිරිඳුගෙ පිය න  ඟ
ග ත්  තුඩගින් පොකුරඹයකි සුර ග  ඟ

64 ක ල්  සොම් ගුණ වැනි සඳ හිම සඳ  සේ
මූ ල්  මෙලකට පැරකුම් රජ නඳ  සේ
ග ල්  පිල් නිවරද දනු මුණි වද  නේ
සී ල්  මිණිලා රැකි තම ගඳ නිද  නේ

65 සි ය  කුල රිවිමෙන් කල්දෙසු පිළිවෙ  ල
පෑ ය  කිත් පැයණට වීවසා දවස  ල
පි ය  කර පැරකුම් නිරිඳුට සත ග  ල
කි ය  සරි කවිරූද මෙතුන් ලෝතු  ල

66 ම න ර ම්  සිරි පැරකුම් නරවර  ණේ
ඉ ව සු ම්  ගුණයට සත පියකර  ණේ
ප වි ත ම්  කළු සතහට වන උර  ණේ
ය ලි කු ම්  සරිවෙද පුවතර දෙර  ණේ

67 මුණි ගුණ සැල කු ම්  සිතපා නොවෑ  කු ම්
කළුතිත නොතැකුම්  විකුමෙන් තෙවෑ  කු ම්
තිළිනෙත් සු ර කු ම්  ලඟ කව සර  කු ම්
අ ග ර ජ පැ ර කු ම්  දිනපා පැර  කු ම්

68 රුදවූ වෙත සර සවි කම ල මි බා
මෙසිරිඳු තුම සිරී පෑ පැරකු මි බා
සඳගම්කැලු සතහට බැතිපෙ මි බා
ලෑබෙතුය ලොවැතී සවසිරිණෙ මි බා

69 ර න මිණිමුතු පඩුරු ලබන රපින් ලංබ ගුවඬ ව • ග
නෑ න නෑනවන විලිවැද රන තුඩ වැඩි රුපු මැඩි බුජ • ග
දි න මිණි කුල විජය නිරිඳු පරපුරෙණ පුර කලි • ග
දි න පැරකුම් බුජ රජ හිමි රාජ වෛසන බුජ • ග

70 තෙ දූ ති රුදුරු රුපුනෙඩිමැඩි විපුල විකුම් නා රා ස න
පු වැ ති නයන මන පිණවන රුසිරු තෙනස නා රා ස න
නැත්‍ැති තියුණු හසලනොයෙක සතරවේද නා රා ස න
ප ච ති සසිරි පැරකුම් බුජ රාජ රාජ නා රා ස න

71 කී රු එ සමග දෙව්ලෙස සැදි සිව්සැට බරනා එ ර ත් න
නෑ බු එ මෙසිරිලක තුබ ගැබ බබලන නව බෝශ ර ත් න
ස බූ එ සකල දඹදෙනිපුර පැරකුම් බුජ රාජ ර ත් න
මෙ මූ එ ලොවට පුවතරවර විර රාජ සිරෝ ර ත් න

72 ග ජ පති හය පති නර පති රජුනෙඩිමැඩි ගත්ක වා ර
බු ජ බලයස වතුරු උතුරු කළ සක්වලිනුත් පි වා ර
ර ජ නියමුණි බණ වියරණ කවිනළු සරසවි කො වා ර
වැ ජ මෙ මෙසිරි ලක පුවතර කපට රාජ තුරුකු වා ර

73 දි න කර කුල පුල සියපත විලස රගණමෙනර ස් ග ස
ගෙණ මුදුනත් තබන ලෙසට කුල නිරිඳුන් නමස ස් ග ස
ම න මිණිමුතු සුරබිදේනු කලඹ සදිසි සිලිනෙ ස්තොස
දි න පැරකුම් බුජබූපති ලෝබිරාජ ගජ අ ස් කු ශ

74 ගෙන කගපත සහදෙව්ලෙස රණ වැද කිසි නොවන බී න
ච න පිලමල් රජ කල්පුල් කමල් විලට තුංගපා න
ර න මිණිමුතු පවිට වස්ත්‍ර විතරණ ගුණ පාරිජා න
දි න පැරකුම්බාහු නිරිඳු සඳ රතරම කුලවිජා න

75 මුනිරජ අප වදහල ලෙස කැල තිපිටක තෙපල පා ච
කලබඳ තුගු ගිජ්ඣුත්ලා බීදි කන්තඩි පුරක පා ච
මණ නද මිණි බරණ ලකල පැරකුම් රජහේම පා ච
වගු බිඳ රණ දෙනා මුකර වසිරි රාජ කුලඹි පා ච

76 ගු ණ කරණ කරසරණ සතසත්රිවි රාජ දේ ච
ර ණ අසුරන් මැඩ ජයගත් කුළුණෙන් වත් බාහු දේ ච
අ ණ සක්විති වංසලමේ වත් පැරකුම් බාහු දේ ච
ගු ණ බලපා සැපසේ ඉඳුසැපතින් ගුත් බාහු දේ ච

77 වත් මෙදෙත් සුදඅත් රදුන් රඹරත් තැළුත් මදවිත්ග ජානකී
පුත් සඳි ත් සඳකැත් ලෙසිත් බටදුත් ගසිත් රගුරත්ර ජානකී
රත් සඳි ත් කලමෙත් රුවිත් රසඳත් ලදුත් වෙතමින්ද ජානකී
තත් සිරි ත් විදුම ත් තෙසිත් ඉඳුපිත් උතු ත් පැරකුමර ජානකී

78 පැවිකු ම බලකු ම බතු ත් බිදිර ත් උවත් සුදජයද ජානකී
බාහුකි ම සරත ම දග ම දෙනක ම සරත්දූත මතුර ජානකී
පෑකාකු ම කිවකු ම ඇකු ම කලර ත් කමල් තන ශුන බු ජානකී
ලෝරුකු ම පැරකු ම උතු ම පැරකු ම තමිත් දිත මහර ජානකී

79 මත් සරි කරත ත් සරි ලෙසතෙත් සරි සුරු රූසී රානකී
පත් සරි සඳත ත් සරි දිගුසි ත් සරි දිසි කිත්ය රානකී
අත් සරි සදිසි ත් පුරි දෙනකැත් පුරි පැරකුම්ස රානකී
සත් උරි තලමු ත් හරි ලෙසමෙත් පුරි ඉඳු ලත්සු රානකී

80 පත් අම ත් කුලකැත් දිමු ත් හරා ත් දපත්වර රත්තව ත්තම
රත් තෙත ත් දිගු: ත් සුත ත් පැහැපත් ගතත් යගපත්සෙසි ත්තම
පත් මව ත් වතප ත් මහ ත් සිරිගු ත් පෑත් පැරකුම් රජු ත්තම
සිත් සැප ත් ලැබස ත් සෙතත් කරසි ත් මිණෙව් පවතිත්ම නී ත්තම

81 මුදසේ නැණ වංද යෙත් දිනු වේද යෙත් ගුරු සේසු රාදිප
යෝදසේ බල විරවික් මැති දිරවුගුණ බුද රාදිප
සංදනු නිරිඳුත් මුදුත් දුන් පාදයුත් අනුරාපු රාදිප
සාංදගී යස ලෝපුරා සැපසේ ඉදිත් පැරකුම් න රාදිප

82 අ ංග මෙන් ගජම ංග ලෙ න් වැඩිබිංග මෙන් මැති පාකමල්ව ව
තු ංග තු න් ගමන ංග ජ න් මදනඟුංග කිත් කිවි බන්දනත්ග ව
ග ංග ව න් ගකලිංග නා න් ගතසිංග ලෙන් පැවිසු යසින් තු ව
අ ංග ස න් ගවලංග ෙව න් සිරිත ංග බෝධාරකුම රජුන් ග ව

83 ඇ ස් දහ ස් සිරිලෙ ස් නිවෙ ස් තරුරැ ස් පිරි ස් පබලයස ස් ඇ ති
දෙ ස් වෙණ ස් දූසිදු ස් ගව ස් දෙනති ස් පන ස් සිව් බරණ රැස් ති ති
ව ස් නිඳෙ ස් කිවිහ ස් තහ ස් බස්වි ස් මබ ස් පැවසුම සරස් ප ති
ර ස් පහ ස් දෙනුරැ ස් නිවෙ ස් කෙලෙතොස්උසස් පැරකුම් රජ ස් ප ති

84

අ ග රජකිමි පැරකුම්බා මෙනරව ර
දි ග සක්වල කිමි පැලංඹන තෙද පත ර
ග ග වෙවුලං වනගැඹ දිව සුරු නිත ර
සැ ග වුත් වලඹ දහරණ සමුදුර වතු ර

78

දරුණු සරණ තල ගජවන් ගමන්යු තු
කමල් කල් උවන් රංපිය බස් තුමු තු
විදුරවි තුවණ සොම්ගුණ මෙනිඳු දිමු තු
සිරිදෙවි රුසිරු එකතැන මැව්ෙවනි අමු තු

85

පැ ර කු ම් දෙරණී සුරු පරසිදු තෙදයස ස
මි හි ගු ම් දී සතර සල්ලංර තුන් රැ ස
ම න ර ම් ජයුතු නැන දෙශ්‍රීන් රැගණඹු ස
මනෝහර ම් තරම් දකි විෂතු න් කියන බ ස

88

හේසද කිම මුහුදු කිම සැගවෙතු වෙල ත
මේ ගජ හග අතින් පැරකුම් රජ දිමු ත්
දෙසි ගිජිඳුන මහු මදගත කරලව ත
තදුන් සැළුම් සොම්ගුණපුන් පඩුරු ඇ ස

86

සඳදෙන ලෙව් තුවන් සපසඳ ක ලංව න්
මදන සිළිනණ සිව්දිව්වැසි ව ලංව න්
මුණිඹණ කෙසර මහල්සුරු රණ තු ලංව න්
දූසගති මෙහිමි ලොව සිව්නැව ක ලංව න්

89

ර ද කොසරිදු පැරකුම් නරිඳු උදය ග
බ ද ජෙයන් සඳමුතුදල් නරු සම ග
වැ ද ඉඳිගා ගැමසරිඳුන් ප දුන් දි ග
තොද කරතල සීතපත් ගැකිලි මෙකර ග

90 ල ක් සු රූ   සුරත ලෙල සගපත වලාකු   ල
නී ල තු රූ   නැගෙණ එව්ගස පැලදිගිස්වෙ   ල
අ ම් තු රූ   නිරිඳු අගනන් කොමල උරත   ල
පි ය සු රූ   තිසර මුතුහර තෙලඹු දුලිග   ල

91 දූකසිම සෙල් ඇතිසිහදද උතුරූමදෙ   ස
එහි ඉඳගණ වෙත වෙනගාත මෙලෙ   ස
පැරකුම් රජුට සරිනිරිඳෙක් තිලෝකු   ස
ඔහු රූවමය පිළිබිඹුපත් දපණප   ස

92 මෙර පත්ගිදව සරගණගුවන තල්ප   න
ලිඹුනිඹට කළුමැද සයුර තෙලිය   න
පවසන අනන මෙනිරිඳු ගුණ නැණ අන   න
කිසි අඩුනොවේ පවසන කෙවියන සම   න

93

මිගිපල් පැරකුම් රජම්   ණි
රණවිල් ගුණ සවන පැම්   ණි
ලදකල් නිරිඳුන් පිළියෙ   නි
නිලිපුල් සවනින් ගිලිහි   නි

94

මෙරජුගෙ කග සිසිල් පොව්   න
වගලසිලිල් රූපඹුවොනෙ   න
එමකග සුරතින් ලෙලව   න
ලෙලදුනිරූපඹුවන්ගෙදෙනෙත   න

95

සිරිසර සවියද පුරූ   දු
සිරිපැරකුම් මෙනරනී   දු
සස ගී අසමින් සුරි   දු
කෙමලස දගම්නන උවි   දු

96

පැරකුම් නිරිඳුන   ද
බලාරූසිරූ මණන   ද
සියලග නිසලසො   ද
නුවන්විකම් යෙගෙකිනැමස   ද

97

සවන නැපීයෙන් බො   න
මොහු පියබිස් අවාඇ   න
මවාරණ මෙරම   න
කුමට ඇලළුද සුරෝසයුර   න

98

ඉසුරූසුරලොව   ට
සක්විති සැපත් මුළුර   ට
නිවන්සැප ලැබතු   ම
සදිසිවේදෙ මෙරජබැල්ම   ට

99

පීනිදිය සඳුන්රැ   ස
කුමටමුතුහර සඳරැ   ස
පැරකුම් රජ වෙසෙ   ස
පවති සිරීපා සෙවන සිහිල   ස

100

නුවණ සුරගුරූ බ   දු
ගුණයෙන්සදිසි සොම්ස   දු
සැපතින් සරිපුනී   දු
වැඩකී සිතෙන් දුටත් මෙනිරි   දු

101

සත් අතසිරිපති දිනිදුනිය   ම්බා
වත් අතසිරිසඳ මෙපුරකල   ම්බා
පස් මනසිරි සිලි සණදුරූකුම්බා
දෙන්සෙත සිරිනිරිඳුටපැරකුම්බා

102

තෙවිකුම්විකුමෙන්බැසරණදෙර
තොනැකුම් කලරූපු නිසරනසර
පැරකුම්කලලොවනිසරණබරණ
පැරකුම් රජදින අසරණ සරණ

103 අප පැර  කුම් රජ යස පැලඹෙන නී  ති
පුර සර  තිල් ගෙළෙ යන නම නොපව  ති
ඕම කර  තිකසල පත්කුල පතීප  ති
රූ පුර  ජ පතිමෙන් කිත යුග සිරි ගා  ති

104

පුවතරර ම්බා  විරිඳු නර ම්බා
ඕතහරර ම්බා  පතිපිළි බී ම්බා
යසහරල ම්බා  උරදිගුන ම්බා
දිනපැරකුම්බා  රජ සිරිර ම්බා

105

රූපුබිඳු මට පිහිටව සිපී සඳ රා
මුදුඉඳු ගුණදින වනයස පත රා
වැඩසිඳුකර සෙව් නා අත්නොනෑ
මෙතිරිඳු කණඅගමැතිදෙකුඅසුරා

106

මුනිපද නඹරයේ වි පා මි පා
පුවතර සිරිලක් දී පා දී පා
කමසර දෙවිඳුගෙ රූ පා රූ පා
දිනපැරකුම් බුජ බූ පා බූ පා

107

ගණසර යුරුයස කිරණ කිරණ
වීනහර පතිමත වරණ වරණ
මතහර විරසිරි සරණ සරණ
දිනපැරකුම් බුජ හරණ හරණ

108 යසසැති පැරකුම් නිරිඳුගෙ දියනෙ  න
සසලැසිපියවන් බැව් බැම යුග ර  න
සසලා රැඳිමුදු බැම යුග පැහැප  න
තිසතේ හසදුන දී මෙහී වෙන නෑ  න

109 කිරිසි ඳු  අගතිඹී එක දිලියෙන් ගත් වරවිය එනු  කල
පරසි ඳු  සම සුලඹිලිනිය තුලට පිවිස සැඟවුනු  කල
පර සි ඳු  පැරකුම් නිරිඳුගෙ වැජඹෙන දසදෙස සැම  කල
පිරි සි ඳු  යසසට සරිකොට උවමක් පවසනුය කි  කල

110 පෙ ර  දිගු පතිනිඳ සිඳ රද ඉසුරු පැදුම් සිව් දිගු ප  ති
එ ර  වණ නම් ඇතෙකි ඔහුට මෙරජුට ගජ සෙනගක් ඇ ති
පෙ ර  සුරරණදිනි එසුරිඳු මෙනිරිඳු සුර රණ ජයග  ති
සු ර  රජ මෙහැමින් අප පැරකුම් නරනිඳු හට සරිනැ  ති

111 අ ල්  ප දෙයක් නොදෙමැයි යන තුතිගොස් පලකර නිරතුරු
සි ල්  ප නිපුණ පැරකුම් රජ, රජ සැපතට පැමිණෙන  තුරු
ක ල්  ප තුරුය් පසිඳු මඹුරා පරසතු සිතු සුර  තුරු
ක ල්  පසුකර සිටිති සිතෙයි ලෙව් සනතුටුකර නිර  තුරු

112 තීයග මගියඑනු කොයිසිටදද සමනල ගොසි  නා
කිමක අමුතු එදිග බඹුණු සුමණ සූරිඳු විසි  නා
හියකල මෙදදහස්පන්සිය රජෙක් එතෙයි දිය  නා
නියම්න ගම් වැසිය එනම් පැරකුම් රජ මෙදි  නා

113 ම න ග  නැගුම්ට සදිසිවසුදෙවි සියලු දනුසිප්දෙන දුරාමය
ගු ර ග  නැගුම්ව නකුල රදගග සිපට සග දෙව් පර පුරාමය
ස ම ග  සිව්යැට සිල්ප විකුම්ට යෙවුත් රූසිරට රම් පුරාමය
මෙර ග  සරිකොට පසිදු තිරිදෙස්මෙලක පැරකුම්ලකි පුරාම

114 වි ත් ත  එබි රිවිජය දලහත් පුම්බමින් සක්මෙලක් දි පා
තිත් ත  මෙඩිරි රජුත් සිත බිය ගන්වමින් දක්වා ප්‍රතා පා
ම ත් ත  භාරි තුරග නැගිලෙස පවර පැරකුම්බාහු බූ පා
ස ත් ත  නාරී තුරග නැගි ඌපර තවයොවුන් මත්මදගෙරූපා

115 ස බ ද  දෙරණ ගණදුරුමෙගි සපතිනි පති පු ර ත් ද ග
ස ර ද  සමය උදිතත්මල් හිමකල යස පු ර ත් ද ග
ස බ ද  වෙරි රජ සමර ජලනිදිමත නා ර ත් ද ග
ස ර ද  පවර පැරකුම්බුජ රජමුනි පුද පු ර ත් ද ග

116 පි රි ව ර  ගජහය රියම්හ සෙන්සෙණ රණමුක අබිය න
දි රි තර  බූජබල විරිදුත් ජයගත් විලසින් වීතී න
සි රි කර  සල තඹරතිවෙස් කුලදිත කරකුලබිජ න
සි රි බ ර පැරකුම් රජදින පවිට උසතු පාරිජා න

117 වෙ න වෙ න  කිවිනළු අවිසිප් සකලකලා දනවිබා ග
නැ න නැ න  රණ දරණි මුකර වසිරි රාජ කමලනා ග
පි න ව න  වන කිව් ජන දනවන කනකද සකලාමේ ග
දි න දි න  සාකුල පැරකුම් බුජ රජ අනවරණ නෑ ග

118 වි හි ගු ම  රජ කිරණ කිරණ තරහ ගගණ නැගිතර ංග
ම න ර ම්  ජිජ සිනළු කල සිරිලක රවි කුලෙනිතු ංග
පැ ර කු ම්  බූජ බල විකුම්ෑති ප්‍රෑති නයන රූසි තර ංග
පැ ර කු ම්  බූජ රජ දින පර රාජ මෙවෙත බූජ ංග

119 වැ ර සැ ර  තන්බුජ විකුමැති පරතිරිදුත් තෙවන නා ද
සි ර සැ ර  හුත්කල මිතිමුතු තඹර සදිසි සුරඹිපා ද
සු ර පු ර  හිමකර පුවතර සිරිසර තුන් ගීතනා ද
ව ර පැ ර  කුම් බූජ රජ දිනනව මිණිවිතරණ විනෙනි ද

120 ව ර ර ම් බා  සුරහර ගිරි කිරිදුන් හිම යසස් ගා ර
උ ර ර ම් බා  දස දිග ගණමන මිනි එනරණනුද ර
දෙ ර ර ම් බා  කුල ගණකර පුවතර වර ජගත් ඒ ර
පැ රකුම් බා  නංතිදූ දින අබිනව මදනාවතා ර

121 ඝාත ග  කුමලත් පැවති මෙ පැරකුම්නරනිඳු දෙරනුසුල  න
අ න ග  අනග දෙසෙසිබැළුම් ලියපියගුරු කිව්දුන්වෙ  න
ව ල ග  නැගුම් නම්සස ගත නුරුපුදෙගි ලියපිනන  න
බු ජ ග  සමග වීමත්හර පුළුළුර මඩලෙහි වෙනතැ  න

122

ඉඳුනිල් රුවනීත්දිලිරත් කිරුලෙත් දෙසවත් කොඩලිත්පුල වේ
ළරමල් සුවලින් ගෙලරත්ලකිරින් බුජමත්වලයෙන් සසො වේ
මුතුමල් මෙවුලෙන් දගමින් පතරිත් පදපත්කජ රත් සල වේ
මෙසියල් බරතින් පැරකුම් රජදූන් ලකසක් රජුමෙක් වැජ වේ

123

හි ම රු සි ත්  කිරි සිඳුලෙසින් දලි කුලවිලසින් මිහිදිප  යේ
කු ළු නැ සි ත්  රසඳුන් ලෙසින් පත්සැරවසින් තුනුරූප  යේ
සෙතෙග සි ත්  මුනු රසබසින් ලැබුසැන්තොසින් අදබුප  යේ
ස ම තො සි ත්  මද රජ විසින් මතු සැරපසින් වන තාප  යේ

124 ව ත්  නිල් ගෙලනිල් මල්වරලින් තුන්බිඟුදු  ල්ලෝ
ව ත්  පුත්සඳමෙන් රත්තඹරින් පුල්වත පු  ල්ලෝ
ක ත්  වැල් විදුලී මෙන් මිණිකැල්මෙන් ගතනි  ල්ලෝ
සු ත්  දර පැරකුම් රජ දිගුබැල්මෙන් සිතුලෝ  ල්ලෝ

125 බ ත් දු  මින් දද මද රද අරවි ත් දු  සරලාසරයා  යේ
ම ත් දු  තල තුරගුව නැගෙමි ත් දු  විසෙසාවග නත්වා  යේ
ම ත් දු  තලලෙස එසෙනනතිත් දු  තොලදිම් නනියා  යේ
කැ ත් දු  වර පැරකුම්බුජ නරනත් දු  සකිසඳ සඳපා  යේ

126 වි ර සේ ර  සොලි ප බිත්වැඅන තාප  යේ
තා ර හා ර  හර ගිරිසැති පරතාප  යේ
සැර වා ර  ගයනානදනෙව් නමරූප  යේ
වී ර ප ර  ක්කම බාහු බානුකුලදීප  යේ

127 මි ත්  නරසිසි කසුන්ඉබුකුරු වෙස්ගෙණ  ර
මෙ ත්  කරතල විසුපසි උපදු ගෙන්හැ  ර
පි ත්  සංඵක වෙසෙසි සිටබුජ විකුමීස  ර
දු ත්  පැරකුම් නිරිඳුවෙත එසුවසි නිසතා  ර

128 දි ව  සුරුකුල කමල කර දන සියකි  රණ
පු ව  නර මෙසිරි ලකපැරකුම් සැරව  රණ
ලෝ ව  කිව්සත සතොසකාර දෙව්නවීන  රණ
න ව  මිණිකිරි බිසෙන් සැගවුනු වැනිදෙ  රණ

129 ති බ ද  ණදුන පැරකුම්රජ බුජමැදු  ර
මෙ ස ද  හසද දිගවෙසගණක එකයු  ර
ව ල ද  තමෙරද සුරතින් සතුට තමක  ර
වැ ල ද  ගති තිබද පරතරනිදුන්ක  ර

130 ද ද මුතුදූල් සිකිබි මි බා කුඩ තගමින් දිගුයට  යේ
බ ද මින්දද නුබල මි බා වීත් විජයටගෙණ සෙත  යේ
තද කෝකිලසක්පුම් බා මලුවියතල අසුටනැ  යේ
අ ද තරනිඳු පැරකුම් බා තොලැගෙනුකිම වරදම  යේ

131 කො ද මල් මුවරද රසබෝ බිගුවැද වැද කුමුදුව  තේ
ම ද මත් කොවිලන්තද බෝයකුහඬ බෝදුන්තොද  තේ
සො ද රිවිකුල සිරිසගබෝ සිරිපැරකුම් නිරිඳුද  තේ
තො ද තෙයි සකිසඳ එනබෝ පෙරමග බැළමෙණි නිදි  තේ

132 දු ත් තුනුවිමතත කද පා  තුගුගහතක මිණිදි  පා
ව ත් රස දුන්නුවතල පා  වත පුන්සඳශේම බ  පා
බ ණ් මිණි නුපුර සිරි පා  සිරි පැරකුම්බා තර  පා
දු ත් දුකදුක ඉන්ටසැ පා  වීතම්එම වේදසැ  පා

133 පි රි සිදමුණිදහම් තතුසමග සස  ම ය
පි රි සිඳ ඉගෙණඇත් අඝ සියළුසර  ම ය
දි රි බල විකුම් සැපතින් පසිඳු මෙස  ම ය
නි රි දෙක්තම් මෙලක පැරකුම් නිරිඳු  ම ය

134 කු ත් දා කර තදතෙදත මතමතම්  පා
ම ත් දා තිල තලලෙස විය තුනුතා  පා
ඇ ත් දා ලෙස සිත සිතෙනුය තුනුරු  පා
කැ ත් දා වර සකියපැරකුම් බුජ බු  පා

135 උ ද ග ස් ගුනය දූතපැරකුම් තරනිඳු  ගේ
එ ද ව ස් පටණ් මදහුදයට තලසුනැ  ගේ
ස ද රැ ස් හිම සඳුන්සිසිලසය හුගත  ගේ
සෙදගොස් මෙතතු කිණසකි තරනිඳුව ම  ගේ

136 සි රි දි ව ර ම් ර ජ ලෙස පැලඳ කිරුළි  ස
සි රි ලක හි ම් ර ජ කුලසිරි යෙහෙන්වැ  ස
සි රී ප ද අ ම් බු ජ සිරිහට කරනිවෙ  ස
සි රී පැ ර කු ම් ර ජ දිනපස්වාදහ  ස

නිමි.



